සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

පාලි I
பாளி I
Pali I

74 STE I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** පාලි ලේඛන රීතියට අනුකූලව නිවැරදිව ලියා ඇති පාඨය සහිත වරණය තෝරන්න.
(1) ආයස්මා වක්කලිත්තෙරො ඉමා ගාථායො අභාසි.
(2) ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං
(3) සුජනප්පසාදසංවෙගත්ථාය කතෙ මහාවංශෙ
(4) ඡ ආදීනවා විකාලවිෂිඛාචරියානුයොගෙ

**2.** අකාරාන්ත පුල්ලිංග **අත්ත** ශබ්දයේ ද්‍විතියා විභක්ති ඒකවචනය කුමක් ද?
(1) අත්තා (2) අත්තනා (3) අත්තනි (4) අත්තානං

**3.** **අජ්ජතග්ගෙ** යන්නෙහි නිවැරදි විසන්ධි රූපය මේවායින් කවරක් ද?
(1) අජ්ජ + අග්ගෙ (2) අජ්ජ + තග්ගෙ
(3) අජ්ජං + අග්ගෙ (4) අජ්ජතං + අග්ගෙ

**4.** **ජෙට්ඨාපචායිකකම්ම** යනු
(1) මවුපියන්ට යුතුකම් ඉටුකිරීම ය.
(2) උසස් අයට සේවය කිරීම ය.
(3) ශ්‍රේෂ්ඨයන් දැක නැගී සිටීම ය.
(4) ජ්‍යෙෂ්ඨයන්ට ගරු සැලකිලි දැක්වීම ය.

**5.** මිනුම් ඒකක ප්‍රකාශ වන පාලි පද යුගලය සහිත වරණය තෝරන්න.
(1) විදත්ථි, රතන (2) මාසක, රූපි (3) හත්ථ, අට්ඨ (4) වටංස, පාමඞ්ග

**6.** **තිට්ඨති** යන ක්‍රියා පදයේ ධාතු ප්‍රකෘතිය තෝරන්න.
(1) √ ඨා (2) √ ඨී (3) √ ඨෙ (4) √ තිට්ඨ

**7.** දිසාවන් පමණක් ප්‍රකාශ වන පද ඇතුළත් වන්නේ කවර වරණයෙහි ද?
(1) උත්තරං, දූරමං (2) උපරිමං, හෙට්ඨිමං
(3) පච්ඡිමං, මජ්ඣිමං (4) දක්ඛිණං, පච්චන්තිමං

**8.** **දුග්ගතිං නාභිජානාමි, බුද්ධපූජායිදං ඵලං** යන්නෙහි ඇතුළත් උපසර්ග සහිත පද ගණන
(1) එකකි. (2) දෙකකි. (3) තුනකි. (4) හතරකි.

**9.** ජානුස්සොණි බ්‍රාහ්මණයා බුදුගුණ වර්ණනා කළ ආකාරය දැක්වෙන සූත්‍රය කුමක් ද?
(1) මහාහත්ථිපදොපම සූත්‍රය (2) මහාසාරෝපම සූත්‍රය
(3) කකචූපම සූත්‍රය (4) චූළහත්ථිපදොපම සූත්‍රය

**10.** නිර්දිෂ්ට ග්‍රන්ථාගත ........... **හි සො පියො හොති**, ........... **හොති අප්පියො** යන ගාථා පාදවල හිස්තැන් සඳහා ගැළපෙන අනුපිළිවෙළින් දැක්වෙන නිවැරදි පද යුගලය තෝරන්න.
(1) අසතං, සතං (2) සතං, අසතං
(3) සන්තං, අසන්තං (4) අසන්තං, සන්තං

**11.** තෙවන ධර්මසංගායනාව අවසානයේ ධර්මප්‍රචාරය සඳහා ස්වර්ණභූමියට වැඩම කළ දූත පිරිස සඳහන් වරණය තෝරන්න.
(1) මජ්ඣන්තික තෙරුන් ප්‍රමුඛ පිරිස
(2) මහාධම්මරක්ඛිත තෙරුන් සහිත පිරිස
(3) සෝණ-උත්තර තෙරුන් දෙනම ප්‍රමුඛ පිරිස
(4) මහින්ද මහතෙරුන් ඇතුළු පිරිස

**12.** පාලි යනු කෝසල දේශයේ රාජ්‍ය භාෂාව වූ බව පවසන ලද්දේ කවුරුන් විසින් ද?
(1) ස්ටෙන් කෝනෝ (2) එච්. ලූඩර්ස්
(3) වෙස්ටර්ගාර්ඩ් (4) රීස් ඩේවිඩ්ස්

**13.** **ගච්ඡ ......... පුච්ඡ මහාරාජ** යන්නෙහි ව්‍යාකරණානුකූලව හිස් තැනට ගැළපෙන පදය කුමක් ද?
(1) තෙසු (2) තං (3) තෙන (4) තම්හා

**14.** ථෙරවාද විනය පිටකය රැකගෙන ආ ආචාර්ය පරම්පරාව සඳහන් පාලි මූලාශ්‍රය යුගලය තෝරන්න.
(1) පරිවාරපාළි, සමන්තපාසාදිකා (2) චුල්ලවග්ගපාළි, සම්මොහවිනොදනී
(3) මහාවග්ගපාළි, සාරත්ථදීපනී (4) පාරාජිකපාළි, පපඤ්චසූදනී

**15.** **අයිරක** යන්නෙහි අර්ථය කවරක් ද?
(1) කුලපුත්‍රයා (2) ණය දෙන්නා
(3) ස්වාමියා (4) වෙළෙන්දා

**16.** ධම්මපදයේ පණ්ඩිත වර්ගයේ සඳහන් පරිදි නැණවත් පුද්ගලයා
(1) නිරන්තරයෙන් ධර්මය හදාරයි. (2) යහපත් දේ පමණක් කතා කරයි.
(3) වරදේදී නිග්‍රහකොට කථාකරයි. (4) විවේකය අපේක්ෂා නොකරයි.

**17.** විනය පිටකයෙහි සඳහන් පරිදි **උභතො විභඞ්ග** යන්නට අපර නාමයක් වන්නේ කවරක් ද?
(1) භික්ඛුවිභඞ්ග (2) භික්ඛුණීවිභඞ්ග (3) සුත්තවිභඞ්ග (4) චුල්ලවිභඞ්ග

**18.** මහාසුපින ජාතකය ජාතකපාළියෙහි කුමන කොටසකට අයත් වේදැයි තෝරන්න.
(1) එකක නිපාතයට ය. (2) දුක නිපාතයට ය.
(3) තික නිපාතයට ය. (4) චතුක්කනිපාතයට ය.

**19.** **'තෙන හි ආචාරියා මම ජීවිතං තුම්හාකං හත්ථෙ, ඛිප්පං මෙ සොත්ථිං කරොථ'** මෙම ප්‍රකාශය කවුරුන් විසින් කා හට කියන ලද්දක් ද?
(1) මල්ලිකා දේවිය විසින් ඇදුරන්ට ය. (2) කොසොල් රජු විසින් බමුණන්ට ය.
(3) කොසොල් රජු විසින් බුදුරදුන්ට ය. (4) මල්ලිකා දේවිය විසින් පුරෝහිතට ය.

**20.** **'දෙවො න සම්මා වස්සිස්සති'** යන්නෙහි වඩාත් නිවැරදි අර්ථය කුමක් ද?
(1) වැස්ස නුසුදුසු ලෙස නො වසින්නේ ය. (2) දෙවියා මැනවින් වැසි වස්වන්නේ ය.
(3) වැසි දෙවියා මැනවින් නො වසන්නේ ය. (4) වැස්ස මැනවින් නො වසින්නේ ය.

**21.** සිගාලක සූත්‍රයට අනුව ආචාර්යවරයා විසින් අතවැස්සාට අනුග්‍රහ කළ යුතු ආකාරය **නොකියවෙන්නේ** පහත දැක්වෙන කවර කරුණකින් ද?
(1) පමත්තං රක්ඛන්ති. (2) මිත්තාමච්චෙසු පටියාදෙන්ති.
(3) සුවිනීතං විනෙන්ති. (4) සුග්ගහීතං ගාහාපෙන්ති.

**22.** යහපත් ඇසුරෙහි අගය අවධාරණය කිරීමට සුදුසු කියමන කුමක් ද?
(1) අත්තානං දමයන්ති පණ්ඩිතා (2) න කාමකාමා ලපයන්ති සන්තො
(3) සුක්කං භාවෙථ පණ්ඩිතො (4) න භජෙ පුරිසාධමෙ

**23.** සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව දේශිත ශ්‍රාවක භාෂිතයක් වන්නේ
(1) ආසිවිසොපම සූත්‍රය ය. (2) බක්කුල සූත්‍රය ය.
(3) මාරතජ්ජනීය සූත්‍රය ය. (4) සාමඤ්ඤඵල සූත්‍රය ය.

**24.** රූපකාලංකාරයක් සහිත පදය තෝරන්න.
(1) ලතායට්ඨී (2) ලඞ්කාභුවදනෙ (3) වෙළුයට්ඨීයො (4) මුත්තාජාති

**25.** '**ආරුය්හ ජම්බුකොලම්හි, නාවං සත්තදිනෙන සො**' යන්නෙහි ජම්බුකොල යනු
(1) රටකි. (2) නගරයකි. (3) තොටුපලකි. (4) විහාරයකි.

**26.** '**අනුජානාමි භික්ඛවෙ සකාය නිරුත්තියා බුද්ධවචනං පරියාපුණිතුං**' යන ප්‍රකාශය සඳහන් වන්නේ චුල්ලවග්ගපාළියේ
(1) ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි ය. (2) පඤ්චසතිකක්ඛන්ධකයෙහි ය.
(3) වත්තක්ඛන්ධකයෙහි ය. (4) සේනාසනක්ඛන්ධකයෙහි ය.

**27.** **ගිලෙති, ගිලිති, පාවෙති, හමති** යන අරුත් දෙන පද පිළිවෙළින් ඇතුළත් වරණය කවරක් ද?
(1) වායන්ති, ප්ලවන්ති, සීදන්ති, ගිලන්ති (2) ප්ලවන්ති, වායන්ති, ගිලන්ති, සීදන්ති
(3) ගිලන්ති, සීදන්ති, ප්ලවන්ති, වායන්ති (4) සීදන්ති, ගිලන්ති, ප්ලවන්ති, වායන්ති

**28.** උදෑසන අවදි වූ සද්ධිවිහාරික භික්ෂුව විසින් උපාධ්‍යායයන් වහන්සේ වෙත ඉටු කළ යුතු වත් කිහිපයක් පහත දැක්වේ. ඒවායේ අනුපිළිවෙළ නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

A - ආසනං පඤ්ඤාපෙතබ්බං
B - දන්තකට්ඨං දාතබ්බං
C - යාගු උපනාමෙතබ්බා
D - මුඛොදකං දාතබ්බං

(1) A, B, C, D (2) B, D, A, C (3) C, A, D, B (4) D, B, C, A

**29.** බුද්ධචරිතය වර්ණනා කිරීම සඳහා පාලි භාෂාවෙන් රචිත ග්‍රන්ථ යුගලයක් වන්නේ
(1) ජිනවංසදීප හා ජිනාලංකාර ය. (2) ජිනචරිත හා සාසනවංසදීප ය.
(3) ලොකප්පදීපකසාර හා රසවාහිනී ය. (4) ජිනකාලමාලී හා සාසනවංසදීපිකා ය.

**30.** **භුම්මත්ථරණ, බිම්බොහන,** හා **පච්චත්ථරණ** යන පාලි වචනවල අර්ථය අනුළිවෙළින් දක්වන වරණය කුමක් ද?
(1) ඇතිරිල්ල, බුමුතුරුණ, කොට්ටය (2) බුමුතුරුණ, කොට්ටය, ඇතිරිල්ල
(3) කොට්ටය, බුමුතුරුණ, ඇතිරිල්ල (4) ඇතිරිල්ල, කොට්ටය, බුමුතුරුණ

**31.** පාලි මහාවංසය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශයක් සහිත වරණය තෝරන්න.
(1) මහාසේන රජුගේ රාජ්‍යාවසානය දක්වා කොටස මහානාම හිමියන් විසින් සම්පාදිත ය.
(2) පාලි පද්‍යමය ග්‍රන්ථයක් වන මෙය සිංහලයන්ගේ උදාරත්වය දක්වන්නකි.
(3) වංසත්ථප්පකාසිනී යනු මහාවංසයට සම්පාදිත එකම ටීකාවයි.
(4) මහාවංසයේ ද්විතීය භාගය 'චූලවංසො නිට්ඨිතො' ලෙස අවසන් වේ.

**32.** අභිධර්ම පිටකය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?
(1) ග්‍රාමවාසී සුමනදේව තෙරුන් විසින් සම්පාදිත නිදානයක් අභිධර්ම පිටකයෙහි වේ.
(2) කථාවත්ථුප්පකරණය බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසු රචනා වූවකි.
(3) ධම්මසංගණිප්පකරණය සඳහා සම්පාදිත අටුවාව අත්ථසාලිනී නම් වේ.
(4) සර්වාස්තිවාදීන්ගේ හා ථේරවාදීන්ගේ අභිධර්ම ප්‍රකරණ මුළුමනින්ම සමාන ය.

- පහත පාඨය කියවා අසා ඇති **33** සිට **36** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මහාපුරිසො රාජානං සමස්සාසෙත්වා මහාජනං බන්ධනා මොචෙත්වා පුන ආකාසෙ ඨත්වා රඤ්ඤො ඔවාදං දත්වා පඤ්චසු සීලෙසු පතිට්ඨාපෙත්වා ඉතො පට්ඨාය මහාරාජ, බ්‍රාහ්මණෙහි සද්ධිං එකතො හුත්වා පසුඝාතයඤ්ඤං නාම මා යජාති ධම්මං දෙසෙත්වා ආකාසෙනෙව අත්තනො වසනට්ඨානං අගමාසි.

**33.** එත්ථ මහාපුරිසො නාම කො?
(1) සම්මාසම්බුද්ධො (2) සිද්ධත්ථකුමාරො
(3) බොධිසත්තො (4) කොසලො රාජා

003129

0304000018813129

**34.** කිං මහාපුරිසෙන දින්නං ඔවාදං?

(1) බ්‍රාහ්මණෙහි සද්ධිං එකතො චර. (2) මහාජනං බන්ධනා මොචෙහි.

(3) ආකාසෙන වසනට්ඨානං ගච්ඡ. (4) පාණෙ ඝාතෙත්වා මා යජ.

**35.** එත්ථ වසනට්ඨානං නාම

(1) සකනිවෙසනං. (2) රාජපාසාදං. (3) ආකාසං. (4) අරඤ්ඤං.

**36.** මෙම පාඨයෙහි ඇතුළත් පූර්වක්‍රියා පද සංඛ්‍යාව කෙතෙක් ද?

(1) හතරකි. (2) හයකි. (3) අටකි. (4) දහයකි.

**37.** විනය පිටකයට අනුව **සංඝාදිසෙස, නිස්සග්ගිය-පාචිත්තිය** හා **පාචිත්තිය** යන ශික්ෂාපද සංඛ්‍යා අනුපිළිවෙළින් අඩංගු වරණය කුමක් ද?

(1) 12, 33, 90 (2) 13, 30, 92 (3) 13, 31, 91 (4) 14, 32, 93

**38.** සසරින් එතෙර වන්නන් ස්වල්ප බව ප්‍රකාශ වන පාලි පාඨය තෝරන්න.

(1) අප්පකා තෙ මනුස්සෙසු, යෙ ජනා පාරගාමිනො

(2) තෙ ජනා පාරමෙස්සන්ති, මච්චුධෙය්‍යං සුදුත්තරං

(3) ඔකා අනොකං ආගම්ම, විවෙකෙ යත්ථ දූරමං

(4) පස්ස සබ්බකිලෙසානං, සුඛෙනන්තං ගමිස්සසි.

**39.** පාලි භාෂාවෙහි ක්‍රියා පද සම්බන්ධයෙන් **අසත්‍ය** ප්‍රකාශය කුමක් ද?

(1) කාලත්‍රයෙහි මෙන්ම පුරුෂත්‍රයෙහි ද වරනැගිය හැකි ය.

(2) ලිංග භේදයක් මෙන්ම ද්විවචනයක් ද නොමැත.

(3) වාක්‍යයක අවසානයේ පමණක් යෙදිය හැකි ය.

(4) ධාතු, ප්‍රත්‍යය හා විකරණ ඇසුරෙන් මෙම පද සෑදේ.

**40.** පහත දැක්වෙන ප්‍රකාශන යුගලය සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර කුමක් ද?

A - මුටසීව රජුට පුතුන් දස දෙනෙක් හා දියණියන් තිදෙනෙක් සිට ඇත.

B - ස්වර්ණපාලියගේ පුත්‍රයා වූ මුටසීව රජුගේ දෙවන පුත්‍රයා දෙවනපෑතිස් ය.

(1) A සහ B සත්‍ය වේ. (2) A සහ B අසත්‍ය වේ.

(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

**41.** '**ඉමං දදාම තෙ නාථ, සරණං හොහි නායක**' යන නිර්දිෂ්ට ග්‍රන්ථාගත ගාථා පාදයන්හි අන්වය වඩාත් නිවැරදිව ප්‍රකාශ වන වරණය තෝරන්න.

(1) නායක ඉමං දදාම නාථ තෙ සරණං හොහි.

(2) නාථ තෙ සරණං හොහි නායක ඉමං දදාම.

(3) නායක ඉමං තෙ දදාම නාථ හොහි සරණං.

(4) නාථ තෙ ඉමං දදාම නායක සරණං හොහි.

**42.** '**කාළපක්ඛෙව චන්දො**' යන උපමාව වඩාත් ගැළපෙන්නේ පහත දැක්වෙන කවර පුද්ගලයාට ද?

(1) අනුක්‍රමයෙන් යසසින් පිරිහෙන්නාට ය.

(2) අව පක්ෂයෙහි සඳ බලන තැනැත්තාට ය.

(3) රාත්‍රියෙහි ඝණ අඳුරේ හුදකලාව ඇවිදින්නාට ය.

(4) සඳ මෙන් දිනෙන් දින බැබලෙන පුද්ගලයාට ය.

**43.** ධර්ම කරුණු යුගල වශයෙන් ගෙන සංග්‍රහ කිරීම ස්වභාව කොට ඇති අභිධර්ම ග්‍රන්ථය කුමක් ද?

(1) ධම්මසඞ්ගණිප්පකරණය (2) විභඞ්ගප්පකරණය

(3) ධාතුකථාප්පකරණය (4) යමකප්පකරණය

44. මහාසුපින ජාතකයට අනුව එළුවන් විසින් දිවියන් අනුභව කරනු දැකීමෙහි අනාගතාර්ථය වන්නේ
(1) පවිටු භික්ෂූන් විසින් කැමති පරිදි සිල්වත් භික්ෂූන් පෙළීම ය.
(2) අධාර්මික රජවරුන් විසින් බාලයන් විනිශ්චයෙහි යෙදවීම ය.
(3) අනාථ මහල්ලන් දරුවන් සතුටු කරමින් ඔවුන්ගෙන් යැපීම ය.
(4) නොදැහැමි රජවරුන් විසින් සතර අගතියෙන් රට පාලනය කිරීම ය.

45. වත්තක්ඛන්ධකයට අනුව පාත්‍රය තැබිය යුතු නිවැරදි පිළිවෙළ ප්‍රකාශ වන්නේ කවර වරණයකින් ද?
(1) ඇඳ හෝ පුටුව මතුපිට පිරිමැද පාත්‍රය දැතින් ගෙන ඒ මත තැබිය යුතු ය.
(2) හිස් භූමිය එක් අතකින් පිසදමා අනෙක් අතින් පාත්‍රය ගෙන එහි තැබිය යුතු ය.
(3) පාත්‍රය එක් අතකින් ගෙන ඇඳ හෝ පුටුව යට පිරිමැද තැබිය යුතු ය.
(4) පාත්‍රය ථවිකාවෙහි බහා බිත්තියෙහි එල්ලා තැබිය යුතු ය.

46. ශබ්දානුප්‍රාස රසය වඩාත් ඉස්මතු වන ගාථා පාද සහිත වරණය තෝරන්න.
(1) අදා සෙනාපතිට්ඨානං, තුට්ඨොරිට්ඨස්ස භූපති
(2) නානානි නානාවණ්ණානි, දිස්සන්තෙ'තිවුටානි ච
(3) පාපමිත්තො පාපසඛො, පාපආචාරගොචරො
(4) හොති පානසඛා නාම, හොති සම්මියසම්මියො

47. කර්මකාරක වාක්‍යයකට නිදසුනක් වන්නේ පහත ඒවායින් කවරක් ද?
(1) එවමස්ස එසා උත්තරා දිසා පටිච්ඡන්නා හොති.
(2) අත්ථක්ඛායී මිත්තො සුහදං පාපා නිවාරෙති.
(3) තෙන හි ගහපතිපුත්ත සුණාහි, සාධුකං මනසිකරොහි.
(4) ඉදං වත්වා සුගතො, අථාපරං එතදවොච සත්ථා.

48. තම වෘත්තිය වගකීම් අනුන් මත පවරන පුද්ගලයෙකුගේ සිතිවිල්ලක් සහිත ප්‍රකාශය තෝරන්න.
(1) අත්තනො පමාණං න ජානාථ? අම්හෙහි සද්ධිං විවදථ?
(2) තෙන හි ආචරිය තුම්හෙ තුම්හාකං කම්මං කරොථ.
(3) තුම්හෙ මමාගමනං උදික්ඛන්තා මුහුත්තං නිසීදථ.
(4) මයං බාහිරකා ජාතා, අබ්භන්තරිකා තරුණදාරකා ජානිස්සන්ති.

49. ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ හොඳම මිත්‍රයා ලෙස තෝරාගත යුත්තේ පහත දැක්වෙන කවර ගුණාංගවලින් යුක්ත තැනැත්තා ද?
(1) ඉදිරියෙහි පමණක් ඔබ වර්ණනා කරන නොදත් දේ කියාදෙන තැනැත්තා ය.
(2) ඔබ කරන සියල්ලට අනුබල දෙන ඔබගේ සැඟවිය යුතු දේ සඟවන්නා ය.
(3) ඔබට පින් පව් මෙන්ම නොදන්නා දෙය කියා දෙමින් යහපත පතන්නා ය.
(4) අනාගතයෙහි දියුණුවට අත දෙන්නෙමියි පවසමින් නිතර ඔබ ළඟ සිටින්නා ය.

50. චුල්ලවග්ගපාළියේ උපජ්ඣාය හා සද්ධිවිහාරික වත් සම්බන්ධයෙන් වඩාත් සුදුසු ප්‍රකාශය මේවායින් කුමක් ද?
(1) එය භික්ෂූන්ගේ සමස්ත කාර්යභාරය හා වගකීම් පිළිබඳ ලේඛනයකි.
(2) වර්තමාන භික්ෂූන්ගේ දිනචරියාවට අදාළ කරගත හැකි නීති මාලාවකි.
(3) භික්ෂුවගේ දෛනික කටයුතුවලට අදාළ ආචාරධර්ම සංග්‍රහයකි.
(4) සංයමයක් නොමැති ගුරු සිසු දෙපක්ෂයට හඳුන්වා දී ඇති නීති මාලාවකි.

* * *

003129

02040000188113129

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | |
|---|---|
| පාලි | II |
| பாளி | II |
| Pali | II |

**74 STE II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**வினாத்தாளை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.**

**Use additional reading time to go through the question paper, select the questions you will answer and decide which of them you will prioritise.**

**උපදෙස්:**

※ **I** කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට ද, **II** හා **III** කොටස්වලින් **එක්** ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න **තුනක් ද** තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සම්පූර්ණයෙන් **එක් භාෂාවකින්** පමණක් සැපයිය යුතු ය.

## I කොටස

**1.** **සිංහලට** නගන්න.

(i) ඡ ඛො'මෙ ගහපතිපුත්ත ආදීනවා සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගෙ: සන්දිට්ඨිකා ධනජානි, කලහප්පවඩ්ඪනී, රොගානං ආයතනං, අකිත්තිසඤ්ජනනී, කොපීනනිදංසනී, පඤ්ඤාය දුබ්බලීකරණීත්වෙව ඡට්ඨං පදං භවති. ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගෙ. ඡ ඛො'මෙ ගහපතිපුත්ත, ආදීනවා විකාලවිසිඛාචරියානුයොගෙ: අත්තාපි'ස්ස අගුත්තො අරක්ඛිතො හොති, පුත්තදාරොපි'ස්ස අගුත්තො අරක්ඛිතො හොති, සාපතෙය්‍යම්පි'ස්ස අගුත්තං අරක්ඛිතං හොති, සඞ්කියො ච හොති පාපකෙසු ඨානෙසු, අභූතවචනඤ්ච තස්මිං රූහති, බහූනඤ්ච දුක්ඛධම්මානං පුරක්ඛතො හොති. ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා විකාලවිසිඛාචරියානුයොගෙ. ඡ ඛො'මෙ ගහපතිපුත්ත ආදීනවා සමජ්ජාභිචරණෙ: ක්ව නච්චං, ක්ව ගීතං, ක්ව වාදිතං, ක්ව අක්ඛානං, ක්ව පාණිස්සරං, ක්ව කුම්භථූණන්ති? ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා සමජ්ජාභිචරණෙ.

(දීඝනිකාය)

(ii) දෙවානංපියතිස්සො ච, ධම්මාසොකො ච තෙ ඉමෙ,
ද්වෙ අදිට්ඨසහායා හි, චිරප්පභූති භූපතී.

භාගිනෙය්‍යං මහාරිට්ඨං, අමච්චං පමුඛං තතො,
දිජං අමච්චං ගණකං, රාජා තෙ චතුරො ජනෙ.

දූතෙ කත්වාන පාහෙසි, බලොඝපරිවාරිතෙ,
ගාහාපෙත්වා අනග්ඝානි, රතනානි ඉමානි සො.

පාටලිපුත්තං ගන්ත්වාන, ධම්මාසොකස්ස රාජිනො,
අදංසු පණ්ණාකාරෙ තෙ, දිස්වා තානි පසීදි සො.

"රතනානී'දිසානෙත්ථ, නත්ථි මෙ" ඉති චින්තිය,
අදා සෙනාපතිට්ඨානං, තුට්ඨො'රිට්ඨස්ස භූපතී.

(මහාවංසය)

(ලකුණු 10 + 10 = 20)



03030000188113129

2. (i) **සිංහලට** නගන්න.

සචෙ උපජ්ඣායො ජන්තාඝරං පවිසිතුකාමො හොති චුණ්ණං සන්නෙතබ්බං. මත්තිකා තෙමෙතබ්බා. ජන්තාඝරපීඨං ආදාය උපජ්ඣායස්ස පිට්ඨිතො පිට්ඨිතො ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ගහෙත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. චුණ්ණං දාතබ්බං. මත්තිකා දාතබ්බා. සචෙ උස්සහති ජන්තාඝරං පවිසිතබ්බං. ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මක්ඛෙත්වා පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරං පවිසිතබ්බං. න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහිතබ්බා. ජන්තාඝරෙ උපජ්ඣායස්ස පරිකම්මං කාතබ්බං. ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං. උදකෙපි උපජ්ඣායස්ස පරිකම්මං කාතබ්බං. නහාතෙන පඨමතරං උත්තරිත්වා අත්තනො ගත්තං වොදකං කත්වා නිවාසෙත්වා උපජ්ඣායස්ස ගත්තතො උදකං පමජ්ජිතබ්බං.

(චුල්ලවග්ගපාළි)

(ii) **පාලියට** නගන්න.

(අ) භික්ෂූන් වහන්සේ නුඹලාට ධර්මය දෙසති.

(ආ) අපි බුදුරජාණන් වහන්සේගේ පා නමදින්නෙමු.

(ඉ) නුඹලා සිවුපාවුන් හෝ පක්ෂීන් හෝ නො මරවු.

(ඊ) දෙවිවරු පොලොවෙහි මිනිසුන් රකිත්වා!

(උ) මොවුහු තෙල් මල් රැගෙන කොහි යහු ද?

(ලකුණු 10 + 10 = 20)

## II කොටස

3. (i) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භන්තෙ, රාජද්වාරෙ බහූහි තුච්ඡකුම්භෙහි පරිවාරෙත්වා ඨපිතං එකං මහන්තං පූරිතකුම්භං අද්දසං, චත්තාරොපි පන වණ්ණා චතූහි දිසාහි චතූහි අනුදිසාහි ච ඝටෙහි උදකං ආහරිත්වා ආහරිත්වා පූරිතකුම්භමෙව පූරෙන්ති, පූරිතපූරිතං උදකං උත්තරිත්වා පලායති, තතොපි පුනප්පුන තත්ථෙව උදකං ආසිඤ්චන්ති, තුච්ඡකුම්භෙ ඔලොකෙන්තාපි නත්ථි. අයං මෙ අට්ඨමො සුපිනො. ඉමස්ස කො විපාකොති? ඉමස්සාපි අනාගතෙයෙව විපාකො භවිස්සති. අනාගතස්මිං හි ලොකො පරිහායිස්සති, රට්ඨං නිරොජං භවිස්සති, රාජානො දුග්ගතා කපණා භවිස්සන්ති, යො ඉස්සරො භවිස්සති තස්ස භණ්ඩාගාරෙ සතසහස්සමත්තා කහාපණා භවිස්සන්ති, තෙ එවං දුග්ගතා සබ්බෙ ජානපදෙ අත්තනොව කම්මෙ කාරෙස්සන්ති, උපද්දුතා මනුස්සා සකෙ කම්මන්තෙ ඡඩ්ඩෙත්වා රාජූනඤ්ඤෙව අත්ථාය පුබ්බණ්ණාපරණ්ණානි ච වපන්තා රක්ඛන්තා ලායන්තා මද්දන්තා පවෙසෙන්තා ... රඤ්ඤො කොට්ඨාගාරමෙව පූරෙස්සන්ති.

(අ) **තුච්ඡ** හා **ඉස්සර** යන පදවල විරුද්ධ පද එක බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.

(ආ) කෘෂිකර්මාන්තයට අදාළ ක්‍රියාකාරකම් **හතරක්** සිංහලෙන් නම් කරන්න.

(ඉ) මෙහි ප්‍රකාශිත සිහිනය කෙටියෙන් ගෙනහැර දක්වන්න.

(ඊ) ඉහත සිහිනයෙහි ප්‍රතිවිපාක පිළිබඳ වර්තමාන සමාජය ඇසුරෙන් විවරණයක් කරන්න.

(ii) පහත වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිර්දිෂ්ට ග්‍රන්ථාගත පරිදි නිදොස් කොට නැවත ලියන්න.

(අ) සචෙ තෙ දෙසො උක්ලාපො හොති තං දෙසො සම්මජ්ජිතබ්බො.

(ආ) මහාරාජ, ඉමස්ස විපාකො නෙව තුම්හෙ කාලෙ න මම කාලෙ භවිස්සන්ති.

(ඉ) තෙසු කථෙන්තා කිං ඉමෙ කථෙන්තී'ති ඉතරො පරිහාසමෙව කරිස්සන්ති.

(ඊ) න උපජ්ඣායෙන භණමානස්ස අන්තරන්තරා කථායො ඔපාතෙතබ්බා.

(උ) එවං භන්තෙ'ති බො සිගාලං ගහපතිපුත්තො භගවතො පච්චස්සොසිං.

(ලකුණු 10 + 10 = 20)

003129

4. (i) පාලි භාෂාව සඳහා යෙදෙන අපරනාම **තුනක්** අදාළ මූලාශ්‍රය ඇසුරෙන් නිදසුන් දක්වමින් විස්තර කරන්න.

(ii) පහත ප්‍රකාශනයන්ට ගැළපෙන සූත්‍ර නාම වරහන් තුළින් තෝරා ලියන්න.

**(ධජග්ගසුත්ත, මහාතණ්හාසංඛයසුත්ත, ඛන්ධසුත්ත, ලක්ඛණසුත්ත, මහාසමයසුත්ත, සතිපට්ඨානසුත්ත)**

(අ) ශක්‍රයාට ඇති වෙනත් නම් පිළිබඳව සඳහන් වන්නකි.

(ආ) මව්කුසක පිළිසිඳ ගැනීමට කරුණු තුනක් එක්විය යුතු බව දැක්වෙන්නකි.

(ඉ) මජ්ඣිම හා සංයුත්ත යන නිකාය දෙකෙහි ම දක්නට ලැබෙන්නකි.

(ඊ) සර්ප වර්ගයන්ට මෛත්‍රී කිරීමට උගන්වන, පිරිත් පොතට ඇතුළත් වූවකි.

(උ) සම්මාපබ්බාජනීය යන අපර නාමයකින් ද සඳහන් වන්නකි.

(iii) දෙවන ධර්ම සංගීතියේ සංවිධාන කටයුතු සිදු කළ ආකාරය කෙටියෙන් ගෙනහැර දක්වන්න.

(iv) කර්තෘ, කාලය හා අන්තර්ගතය ප්‍රකාශ වන පරිදි පහත දැක්වෙන ග්‍රන්ථයන්ගෙන් **දෙකක්** හඳුන්වන්න.

(අ) දාඨාවංස (ආ) හත්ථවනගල්ලවිහාරවංස

(ඉ) ජිනචරිත (ඊ) සමන්තකූටවණ්ණනා

(ලකුණු 5 + 5 + 5 + 5=20)

5. (i) පහත එක් එක් ප්‍රකාශනයන්හි දක්නට ලැබෙන කාව්‍ය ලක්ෂණ පෙන්වා දෙන්න.

(අ) උච්ඡුයන්තෙ උච්ඡුකා විය මනුස්සෙ පීළෙන්තා

(ආ) සන්තවෙසො ගුණනිධි, කරුණාමතිසාගරො

(ඉ) අනොමනාමො අමිතො නාමෙන පදුමුත්තරො

(ඊ) සුඛිතා ත්වං අම්හාකං කණ්ණමූලෙ ආසිවිසං චරන්තං න ජානාසි.

(උ) බුද්ධකරුක්ඛානං පුප්ඵං විය තාසං උතුනීභාවො

(ii) පහත ගාථාපාදවල ව්‍යාකරණානුකූලව සන්ධි කළ හැකි පද සන්ධි කොට නිර්දිෂ්ට ග්‍රන්ථාගත විරිතට අනුව නැවත සකස් කරන්න.

(අ) අථ අයං ඉතරා පජා, තීරං එවානුධාවති

(ආ) අනන්ත ආදීනවො කායො, විසරුක්ඛසම උපමො

(ඉ) ත්වං අපි ඉමානි රතනානි, උත්තමානි නර උත්තම

(ඊ) තං අහං ධම්මමඤ්ඤාය, අරහත්තං අපාපුණිං

(උ) තස්ස අච්චයෙ තස්ස සූතො, මුටසීවො ඉති විස්සුතො

(iii) සිගාල සූත්‍රයට අනුව A කොටසේ දැක්වෙන යුතුකම් හා වගකීම්වලට සම්බන්ධ යුගලයන් B කොටසින් තෝරා ලියන්න.

| A | B |
|---|---|
| (අ) අච්ඡරියානං රසානං සංවිභාගෙන | භාර්යාවගෙන් ස්වාමියාට |
| (ආ) කල්‍යාණෙන මනසා අනුකම්පන්ති | දෙමාපියන්ගෙන් දූදරුවන්ට |
| (ඉ) සම්භතඤ්ච අනුරක්ඛති | ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට |
| (ඊ) මිත්තාමච්චෙසු පටියාදෙන්ති | ස්වාමියාගෙන් සේවකයාට |
| (උ) පතිරූපෙන දාරෙන සංයොජෙන්ති | මහණ-බමුණන්ගෙන් ගිහියාට |

(iv) මහාවංසයේ නිර්දිෂ්ට කොටසට අනුව දෙවනපෑතිස් රජුගේ අභිෂේකයට සමගාමීව පහළ වූ අසිරිමත් සිදුවීම් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 5+5+5+5 =20)

02030000188113129

## III කොටස

**6.** (i) පහත දැක්වෙන නිපාත පදවල අර්ථ ලියා දක්වන්න.

(අ) අන්තරන්තරා
(ආ) අථාපරං
(ඉ) ඛිප්පං
(ඊ) පච්ඡතො
(උ) භියෙයා
(ඌ) මුහුත්තං
(එ) සචෙ
(ඒ) සබ්බත්ථ
(ඔ) සියා
(ඕ) හෙට්ඨා

(ii) පහත සඳහන් පාලි සංඛ්‍යා නාම ඉලක්කමෙන් ලියන්න.

(අ) අට්ඨාසීති
(ආ) චතුරො
(ඉ) ඡබ්බීස
(ඊ) තිස්සො
(උ) ද්වාදස
(ඌ) දුවෙ
(එ) පඤ්චසත
(ඒ) සට්ඨී
(ඔ) සත්තරස
(ඕ) සතසහස්ස

(iii) පහත දැක්වෙන නාම පදවල **ශබ්ද ප්‍රකෘතිය** හා **විභක්තිය** පෙන්වා දෙන්න.

(අ) අනාගතස්මිං
(ආ) එතෙසං
(ඉ) ධානෙහි
(ඊ) පඤ්ඤවා
(උ) පරම්හා
(ඌ) පාපතො
(එ) මුනෙ
(ඒ) රජෙන
(ඔ) රාජිනො
(ඕ) සිලානං

(iv) පහත දැක්වෙන පදවල **සමාස** නම් කරන්න.

(අ) අග්ගබ්‍රාහ්මණො
(ආ) අනෙකසතපොරිසෙ
(ඉ) කායබන්ධනං
(ඊ) ඛජ්ජභොජ්ජං
(උ) පත්තචීවරං
(ඌ) පාපමිත්තානුයොගො
(එ) පාරගාමිනො
(ඒ) යාවජීවං
(ඔ) වජ්ජදස්සිනං
(ඕ) සත්තාහබ්භන්තරෙ

(ලකුණු 5+5+5+5 =20)

**7.** (i) නිවැරදි පද යොදා පහත දැක්වෙන ගාථාවෙහි හිස්තැන් පුරවන්න.

න අත්තහෙතු න .............................. ,
න ...................... න ධනං න රට්ඨං,
න ඉච්ඡෙය්‍ය .............. සමිද්ධිමත්තනො,
............ සීලවා පඤ්ඤවා ධම්මිකො .........

(ii) පහත දැක්වෙන පදවලට සමානාර්ථවත් පද වරහන් තුළින් තෝරා ලියන්න.
**(සලිලං, සාමි, උක්ලාපො, සහායො, භූපො, නිද්දං, අරහා, සන්තො, දාරා, මුසා, සග්ගං)**

(අ) අභූතං
(ආ) උදකං
(ඉ) ඛීණාසවො
(ඊ) නරිස්සරො
(උ) භරියා
(ඌ) මිත්තො
(එ) සඞ්කාරං
(ඒ) සප්පුරිසො
(ඔ) සුගතිං
(ඕ) සොප්පං

(iii) 'ධම්මපදයේ පණ්ඩිත වග්ගය පුද්ගලයාගේ මෙලොව-පරලොව දියුණුවට අදාළ සදුපදේශයන්ගේ සංග්‍රහයකි' නිදසුන් **පහක්වත්** ඇසුරෙන් මෙම ප්‍රකාශය සනාථ කරන්න.

(iv) වක්කලී තෙරුන් තුළ බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැවති ශ්‍රද්ධාව හා භක්තිය වක්කලිත්ථෙරාපදානය ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 5+5+5+5 =20)

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 74 - පාලි

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# ලකුණුදීමේ පටිපාටිය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024
## 74 - පාලි
## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

1 පත්‍රය - කාලයඃ පැය 02 යි.

මෙම ප්‍රශ්න පත්‍රය වරණ 04 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

2 පත්‍රය - කාලයඃ පැය 03 යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 03 කින් සමන්විත ය.

1 කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න 02 කින් සමන්විත ය.

1 ප්‍රශ්නය : (I) පාලියෙන් සිංහලට පරිවර්තනය (ලකුණු 10)

(II) පාලියෙන් සිංහලට පරිවර්තනය (ලකුණු 10)

2 ප්‍රශ්නය : (I) පාලියෙන් සිංහලට පරිවර්තනය (ලකුණු 10)

(II) සිංහලෙන් පාලියට පරිවර්තනය (ලකුණු 10)

2 කොටස

ප්‍රශ්න තුනකින් සමන්විත ය. ප්‍රශ්න එකක් හෝ තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ය.

3 ප්‍රශ්නය

(I) අවබෝධය පරීක්ෂා කරන ප්‍රශ්නයකි. දෙනු ලබන ඡේදයක් ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.

(ලකුණු 10)

(II) වාක්‍යය රචනය හා නිර්මාණය පිළිබඳ පරීක්ෂා කරන ප්‍රශ්නයකි. වාක්‍යවල වැරදි නිවැරදි කොට නැවත ලියා දක්විය යුතු ය.

4 ප්‍රශ්නය : සාහිත්‍ය හා සාහිත්‍ය ඉතිහාසය කොටස් හතරකින් යුතු ව්‍යුහගත රචනා ප්‍රශ්නයකි.

(ලකුණු 20)

5 ප්‍රශ්නය : සාහිත්‍ය විචාරය, රසාස්වාදය හා හරධර්ම චරිතායනය පිළිබඳ කොටස් හතරකින් යුතු ව්‍යුහගත රචනා ප්‍රශ්නයකි.

(ලකුණු 20)

3 කොටස

6 ප්‍රශ්නය : පාලි ව්‍යාකරණය පිළිබඳ කොටස් හතරකින් යුතු ව්‍යුහගත රචනා ප්‍රශ්නයකි.

(ලකුණු 20)

7 ප්‍රශ්නය : ස්මෘතිය හා ධර්මාර්ථ විවරණය පිළිබඳ පරීක්ෂා කරන කොටස් හතරකින් යුතු ව්‍යුහගත රචනා ප්‍රශ්නයකි.

(ලකුණු 20)

2 පත්‍රය සඳහා මුළු ලකුණු = 100
අවසාන ලකුණු ගණනය කිරීම : 1 පත්‍රය = 100
2 පත්‍රය = 100
අවසාන ලකුණ = 200-2=100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ................................................
................................................
................................................ √ △ $\frac{4}{5}$

(ii) ................................................
................................................
................................................ √ △ $\frac{3}{5}$

(iii) ................................................
................................................
................................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.
3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.
4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

### ලකුණු ලැයිස්තු සකස් කිරීම :

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2024

| විෂය අංකය<br>பாட இலக்கம் | 74 | විෂයය<br>பாடம் | පාලි |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 1 | 31. | 4 | 41. | 4 |
| 02. | 4 | 12. | 4 | 22. | 4 | 32. | 3 | 42. | 1 |
| 03. | 1 | 13. | 2 | 23. | 2 | 33. | 3 | 43. | 4 |
| 04. | 4 | 14. | 1 | 24. | 2 | 34. | 4 | 44. | 1 |
| 05. | 1 | 15. | 3 | 25. | 3 | 35. | 4 | 45. | 3 |
| 06. | 1 | 16. | 3 | 26. | 1 | 36. | 3 | 46. | 3 |
| 07. | 2 | 17. | 3 | 27. | 4 | 37. | 2 | 47. | 1 |
| 08. | 2 | 18. | 1 | 28. | 2 | 38. | 1 | 48. | 4 |
| 09. | 4 | 19. | 2 | 29. | 1 | 39. | 3 | 49. | 3 |
| 10. | 2 | 20. | 4 | 30. | 2 | 40. | 4 | 50. | 3 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

# I කොටස

## 01. ප්‍රශ්නය

### (i) සිංහලට නගන්න

ඡ ඛො'මෙ ගහපතිපුත්ත ආදීනවා සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගෙ: සන්දිට්ඨිකා ධනජානි,කලහප්පවඩ්ඪනී, රොගානං ආයතනං, අකිත්තිසඤ්ජනනී, කොපීනනිදංසනී, පඤ්ඤාය දුබ්බලීකරණීත්වෙව ඡට්ඨං පදං භවති. ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා සුරාමෙරයමජ්ජප්පමාදට්ඨානානුයොගෙ. ඡ ඛො'මෙ ගහපතිපුත්ත, ආදීනවා විකාලවිසිඛාචරියානුයොගෙ: අත්තාපි'ස්ස අගුත්තො අරක්ඛිතො හොති, පුත්තදාරොපි'ස්ස අගුත්තො අරක්ඛිතො හොති, සාපතෙය්‍යම්පි'ස්ස අගුත්තං අරක්ඛිතං හොති, සඞ්කියො ච හොති පාපකෙසු ඨානෙසු, අභූතවචනඤ්ච තස්මිං රූහති, බහූනඤ්ච දුක්ඛධම්මානං පුරක්ඛතො හොති. ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා විකාලවිසිඛාචරියානුයොගෙ. ඡ ඛො'මෙ ගහපතිපුත්ත ආදීනවා සමජ්ජාභිචරණෙ: ක්ව නච්චං, ක්ව ගීතං, ක්ව වාදිතං, ක්ව අක්ඛානං, ක්ව පාණිස්සරං, ක්ව කුම්භථූණන්ති? ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා සමජ්ජාභිචරණෙ.

(දීඝනිකාය)

## ආදර්ශ පිළිතුර

ගෘහපති පුත්‍රය, මදයට හා ප්‍රමාදයට හේතුවන සුරාපානයේ යෙදීමෙහි මේ ආදීනව හයකි. මෙලොව වශයෙන් ධනහානිය, කලහ වැඩීම, රෝගයන්ට කාරණයක් වීම, අපකීර්තියක් ඇතිවීම, විළිබිය නැතිවීම හා නුවණ දුර්වලවීම යන සයවෙනි කරුණ ද වෙයි. ගෘහපති පුත්‍රය, මදයට හා ප්‍රමාදයට හේතුවන සුරාපානයේ යෙදීමෙහි මේ ආදීනව හය වෙයි. ගෘහපති පුත්‍රය, නොකල්හි වීථි සංචාරයෙහි මේ ආදීනව හය වෙයි. තමා ද ප්‍රවේශම් නොකරන ලද්දේ නොරක්නා ලද්දේ වෙයි. ඔහුගේ අඹුදරුවෝ ද ප්‍රවේශම් නොකරන ලද්දාහු නොරක්නා ලද්දාහු වෙති . ඔහුගේ වස්තුව ද ප්‍රවේශම් නොකරන ලද්දේ නොරක්නා ලද්දේ වෙයි. පව්වූ ක්‍රියාවන්හි සැකකටයුත්තේ ද වෙයි. ඔහු කෙරෙහි නොසිදු වූ (අභූත) කථා ද පැනනගී. බොහෝ වූ දුක්දොම්නස් හිරිහැරවලට ද පෙරටු වූවෙක් වෙයි. ගෘහපති පුත්‍රය, නොකල්හි වීථි සංචාරයෙහි මේ ආදීනව වෙයි. ගෘහපති පුත්‍රය උත්සව දර්ශන පිණිස යාමෙහි මේ ආදීනව හය වෙයි. නැටුම් කොතැන්හි ද? ගී ගැයුම් කොතැන්හි ද? වැයුම් කොතැන්හි ද? ආඛ්‍යාන (රාමායණාදි කථාකීම) කොතැන්හි ද? කයිතාලම් (අත්තාලම්) ගැසීම කොතැන්හි ද? කළ පිඹීම් කොතැන්හි ද යනුවෙනි. ගෘහපති පුත්‍රය, උත්සව දර්ශන පිණිස යෑමේ මේ ආදීනව හය වෙයි.

**(ii) සිංහලට නගන්න**

**දෙවානංපියතිස්සො ච, ධම්මාසොකො ච තෙ ඉමෙ,**
**ද්වෙ අදිට්ඨසහායා හි, චිරප්පභුති භූපතී.**

**භාගිනෙය්‍යං මහාරිට්ඨං, අමච්චං පමුඛං තතො,**
**දිජං අමච්චං ගණකං, රාජා තෙ චතුරො ජනෙ.**

**දූතෙ කත්වාන පාහෙසි, බලොඝපරිවාරිතෙ,**
**ගාහාපෙත්වා අනග්ඝානි, රතනානි ඉමානි සො.**

**පාටලිපුත්තං ගන්ත්වාන, ධම්මාසොකස්ස රාජිනො,**
**අදංසු පණ්ණාකාරෙ තෙ, දිස්වා තානි පසීදි සො.**

**"රතනානී'දිසානෙත්ථ, නත්ථි මෙ" ඉති චින්තිය,**
**අදා සෙනාපතිට්ඨානං, තුට්ඨො'රිට්ඨස්ස භූපතී.**

**(මහාවංස)**

**(ලකුණු 10 + 10 = 20)**

## ආදර්ශ පිළිතුර

දේවානම්පියතිස්ස ද ධර්මාශෝක ද යන ඒ මේ රජවරු දෙදෙනා වනාහි බොහෝ කලක පටන් ඔවුනොවුන් නොදුටු යහළුවෝ වූහ.

ඒ රජතුමා බෑණා වූ මහා අරිට්ඨ ඇමතියා ප්‍රමුඛ (තාලිපබ්බත නම් වූ) බ්‍රාහ්මණයා ද, (මල්ල නම්) ඇමතියා ද, (තිස්ස) ගණකයා ද යන ඒ සතර දෙනා බලසේනා පිරිවැරූ දූතයන් කොට මේ අනර්ඝ රත්නයන් ගන්වා (ගැනීමට සලස්වා) යැවීය.

පැළලුප් නුවරට ගොස් ධර්මාශෝක රජුට ඒ පඬුරු දුන්හ. ඔහු ඒවා දැක පැහැදුණේය.

මෙවැනි මැණික් මට මෙහි නැතැයි මෙසේ සිතා සතුටු වූ රජතුමා අරිට්ඨ ඇමතිට සෙන්පති තනතුරක් දුන්නේය.

## ලකුණු දීමේ ක්‍රමය

(i) කොටසට හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි පාඨය සිංහලට නැගීමේ දී නිවැරදි අවබෝධය සඳහා ලකුණු **අටක්** ද ව්‍යාකරණානුකූල භාෂා භාවිතය සඳහා ලකුණු **දෙකක්** ද වශයෙන් සලකා ලකුණු පිරිනමන්න. දුෂ්කර පද අතහරිමින් මනඃකල්පිතව කෙරෙන පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

(ii) කොටසට හිමි ලකුණු සංඛ්‍යාව ද **10කි.** එහි නිවැරදි එක් ගාථා පරිවර්තනයකට ලකුණු **02** බැගින් සලකා ලකුණු දීම සුදුසු ය. නිවැරදි අවබෝධය හා ව්‍යාකරණානුකූල බව හා අන්වයට අනුව නොමැති පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

## 02. ප්‍රශ්නය

**(i) සිංහලට නගන්න.**

**සචෙ උපජ්ඣායො ජන්තාඝරං පවිසිතුකාමො හොති චුණ්ණං <u>සන්නෙතබ්බං</u>. මත්තිකා තෙමෙතබ්බා. ජන්තාඝරපීඨං ආදාය උපජ්ඣායස්ස පිට්ඨිතො පිට්ඨිතො ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ගහෙත්වා එකමන්තං <u>නික්ඛිපිතබ්බං</u>. චුණ්ණං දාතබ්බං. මත්තිකා දාතබ්බා. සචෙ උස්සහති ජන්තාඝරං පවිසිතබ්බං. ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං <u>මක්ඛෙත්වා</u> පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරං පවිසිතබ්බං. න ථෙරෙ භික්ඛූ <u>අනුපඛජ්ජ</u> නිසීදිතබ්බං. න නවා භික්ඛූ ආසනෙන පටිබාහිතබ්බා. ජන්තාඝරෙ උපජ්ඣායස්ස <u>පරිකම්මං</u> කාතබ්බං. ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං. උදකෙපි උපජ්ඣායස්ස පරිකම්මං කාතබ්බං. නහානෙන පඨමතරං උත්තරිත්වා අත්තනො ගත්තං වොදකං කත්වා නිවාසෙත්වා උපජ්ඣායස්ස ගත්තතො උදකං පමජ්ජිතබ්බං.**

**(චුල්ලවග්ගපාළි)**

### ආදර්ශ පිළිතුර

ඉදින් උපාධ්‍යායවරයා ගිනිහල් ගෙයට පිවිසෙනු කැමති වෙයි නම් සුණු දියෙන් තෙමා පිඩු කළ යුතුය. මැටි තෙමිය යුතුය. ගිනිහල් ගෙහි පුටුවගෙන උපාධ්‍යායවරයාගේ පසුපසින් ගොස් ගිනිහල්ගෙහි පුටුව දී සිවුර පිළිගෙන එකක් පසෙක තැබිය යුතුය. සුණු දිය යුතුය. මැටි දිය යුතුය. ඉදින් හැකි වෙයි නම් ගිනිහල් ගෙට පිවිසිය යුතුය. ගිනිහල් ගෙට පිවිසෙන තැනැත්තා විසින් මැටියෙන් මුහුණ තවරාගෙන ඉදිරිපසින් පිටුපසින් ද (සිරුර) වසා ගිනිහල්ගෙට පිවිසිය යුතුය. ස්ථවිර භික්ෂූන්ගේ ඇඟ ගැටෙන සේ නොහිඳිය යුතුය. නවක භික්ෂූන් අසුනෙන් බැහැර නොකළ යුතුය. ගිනිහල්ගෙහි උපාධ්‍යායවරයාගේ ඇඟ ඉලීම් ආදි පිරියම් කළ යුතුය. ගිනිහල්ගෙයින් නික්මෙන්නා විසින් ගිනිහල් ගෙහි පුටුව රැගෙන ඉදිරිපසින් ද පිටුපසින් ද සිරුර වසා ගිනිහල් ගෙයින් නික්මිය යුතුය. ජලයෙහි දී ද උපාධ්‍යායවරයාට පිරියම් කළ යුතුය. ස්නානය කරන්නා විසින් පළමුවම ගොඩට පැමිණ තමාගේ ශරීරය දිය රහිත කොට (පිසදමා) හැඳ පෙරව උපාධ්‍යායවරයාගේ ශරීරයෙහි දිය පිස දැමිය යුතුය.

**(ii) පාලියට නගන්න.**

**(අ) භික්ෂූන් වහන්සේ නුඹලාට ධර්මය දෙසති.**

**(ආ) අපි බුදුරජාණන් වහන්සේගේ පා නමදින්නෙමු.**

**(ඉ) නුඹලා සිවුපාවන් හෝ පක්ෂීන් හෝ නො මරවු.**

**(ඊ) දෙවිවරු පොළොවෙහි මිනිසුන් රකිත්වා!**

**(උ) මොවුහු තෙල් මල් රැගෙන කොහි යහු ද?**

### ආදර්ශ පිළිතුරු

(අ) භික්ඛූ තුම්හාකං ධම්මං දෙසෙති.

(ආ) මයං බුද්ධස්ස පාදෙ නමස්සිස්සාම.

(ඉ) තුම්හෙ පසවො වා පක්ඛී වා න මාරෙථ.

(ඊ) දෙවා පඨවියං මනුස්සෙ රක්ඛන්තු.

(උ) ඉමෙ තෙලපුප්ඵානි ගහෙත්වා කුත්ථ (කුහිං) ගච්ඡන්ති?

(ලකුණු 10 + 10 = 20)

## ලකුණු දීමේ ක්‍රමය

(i) කොටසට හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි පාඨය සිංහලට නැගීමේදී නිවැරදි අවබෝධය සඳහා ලකුණු **අටක්** ද ව්‍යාකරණානුකූල භාෂා භාවිතය සඳහා ලකුණු **දෙකක්** ද වශයෙන් සලකා ලකුණු පිරිනමන්න. දුෂ්කර පද අතහරිමින් මනඃකල්පිතව කෙරෙන පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

(ii) කොටසට ද හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි නිවැරදි එක් වාක්‍යයකට ලකුණු **දෙක** බැගින් පිරිනමන්න. එක් දෝෂයක් පමණක් ඇති වාක්‍යයකට **ලකුණු එකහමාරක්** ද වැරදි දෙකක් ඇති වාක්‍යයකට **එක් ලකුණක්** ද බැගින් පිරිනමන්න. වැරදි දෙකකට වඩා ඇත්නම් ලකුණු හිමි නොවේ.

## II කොටස

### 03. ප්‍රශ්නය

**(i) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**භන්තෙ, රාජද්වාරෙ බහූහි තුච්ඡකුම්භෙහි පරිවාරෙත්වා ඨපිතං එකං මහන්තං පූරිතකුම්භං අද්දසං, චත්තාරොපි පන වණ්ණා චතූහි දිසාහි චතූහි අනුදිසාහි ච ඝටෙහි උදකං ආහරිත්වා ආහරිත්වා පූරිතකුම්භමෙව පූරෙන්ති, පූරිතපූරිතං උදකං උත්තරිත්වා පලායති, තතොපි පුනප්පුන තත්ථෙව උදකං ආසිඤ්චන්ති, තුච්ඡකුම්භෙ ඔලොකෙන්තාපි නත්ථි. අයං මෙ අට්ඨමො සුපිනො. ඉමස්ස කො විපාකොති? ඉමස්සාපි අනාගතෙයෙව විපාකො භවිස්සති අනාගතස්මිං හි ලොකො පරිහායිස්සති, රට්ඨං නිරොජං භවිස්සති, රාජානො දුග්ගතා කපණා භවිස්සන්ති, යො ඉස්සරො භවිස්සති තස්ස භණ්ඩාගාරෙ සතසහස්සමත්තා කහාපණා භවිස්සන්ති, තෙ එවං දුග්ගතා සබ්බෙ ජානපදෙ අත්තනොව කම්මෙ කාරෙස්සන්ති, උපද්දුතා මනුස්සා සකෙ කම්මන්තෙ ඡඩ්ඩෙත්වා රාජූනඤ්ඤෙව අත්ථාය පුබ්බණ්ණාපරණ්ණානි ච වපන්තා රක්ඛන්තා ලායන්තා මද්දන්තා පවෙසෙන්තා ... රඤ්ඤො කොට්ඨාගාරමෙව පූරෙස්සන්ති.**

(අ) **තුච්ඡ** හා **ඉස්සර** යන පදවල විරුද්ධ පද එක බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.

(ආ) කෘෂිකර්මාන්තයට අදාළ ක්‍රියාකාරකම් හතරක් සිංහලෙන් නම් කරන්න.

(ඉ) මෙහි ප්‍රකාශිත සිහිනය කෙටියෙන් ගෙනහැර දක්වන්න.

(ඊ) ඡේදයේ සඳහන් සිහිනයෙහි අනාගත ප්‍රතිවිපාක පිළිබඳ වර්තමාන සමාජ සන්දර්භය ඇසුරෙන් විවරණයක් කරන්න.

### ආදර්ශ පිළිතුරු

(අ) තුච්ඡ - පූරිත

ඉස්සර - දුග්ගත

(ආ) 1. වැපිරීම 2. රැකීම 3. කැපීම (අස්වනු නෙළීම) 4. මැඩීම 5. අටුකොටුවලට ප්‍රවේශකිරීම

(ඉ) රජ දොරටුවෙහි පිරිවරනලද හිස් කළගෙඩි තිබිය දී මැද පිහිටි විශාල වූ පිරුණු කළයම සතර දිගින් සතර අනුදිගින් පැමිණ සතර වර්ණයම එකතුවී ජලය ගෙනවුත් පිරවීම හා කළය උතුරා ගලාගියත් එහි ම ජලය වක්කරන අතර හාත්පස ඇති හිස්කළගෙඩි දෙස කිසිවෙක් නොබැලීම.

(ඊ)

- දුප්පත් මිනිසුන් සිටිය දී පොහොසතුන්ට ම රටේ ධනය ගලායාම.
- පොදු ජනයා මහන්සියෙන් හම්බකරන සියල්ල බදු වශයෙන් දේශපාලනඥයන් හා බලවතුන් එකතුකරගෙන භුක්තිවිඳීම.
- පොදු ජනයා බලවතුන්ගේ පීඩාවන්ට බියෙන් තමා උපයන සියල්ල තම දරු මුණුපුරන්ගේ ආහාරපාන ගැනවත් නොසලකා විදුලිබිල් ජලබිල් ආදිය සඳහා බදු වශයෙන් ගෙවීම.

(ii) පහත වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිර්දිෂ්ට ග්‍රන්ථාගත පරිදි නිදොස් කොට නැවත ලියන්න.

(අ) සචෙ තෙ දෙසො උක්ලාපො හොති තං දෙසො සම්මජ්ජිතබ්බො.

(ආ) මහාරාජ, ඉමස්ස විපාකො නෙව තුම්හෙ කාලෙ න මම කාලෙ භවිස්සන්ති.

(ඉ) තෙසු කරෙන්තා කිං ඉමෙ කරෙන්තී'ති ඉතරො පරිභාසමෙව කරිස්සන්ති.

(ඊ) න උපජ්ඣායෙන භණමානස්ස අන්තරන්තරා කථායො ඔපාතෙතබ්බා.

(උ) එවං භන්තෙ'ති බො සිගාලං ගහපතිපුත්තො භගවතො පච්චස්සොසිං.

(ලකුණු 10 + 10 = 20)

## ආදර්ශ පිළිතුරු

(අ) සචෙ **සො** දෙසො උක්ලාපො හොති **සො** දෙසො සම්මජ්ජිතබ්බො.

(ආ) මහාරාජ, ඉමස්ස විපාකො නෙව **තව** කාලෙ න මම කාලෙ **භවිස්සති.**

(ඉ) තෙසු **කරොන්තෙසු** කිං ඉමෙ කරෙන්තී'ති **ඉතරෙ** පරිභාසමෙව කරිස්සන්ති.

(ඊ) න **උපජ්ඣායස්ස** භණමානස්ස අන්තරන්තරා **කථා** ඔපාතෙතබ්බා.

(උ) එවං භන්තෙ'ති බො **සිගාලකො** ගහපතිපුත්තො භගවතො **පච්චස්සොසි.**

## ලකුණු දීමේ ක්‍රමය

(i) කොටසට හිමි **ලකුණු සංඛ්‍යාව 10කි.** එහි ප්‍රශ්න හතරේ නිවැරදි පිළිතුරු සඳහා පිළිවෙළින් **ලකුණු** 1 + 2 + 3 + 4 බැගින් හිමි වේ.

(ii) කොටසේ එක් නිවැරදි කිරීමකට **ලකුණු** 1 බැගින් **ලකුණු 10ක්** පිරිනමන්න.

## 04. ප්‍රශ්නය

**(i)** පාලි භාෂාව සඳහා භාවිත අපරනාම තුනක් අදාළ මූලාශ්‍රය ඇසුරෙන් නිදසුන් දක්වමින් විස්තර කරන්න.

**(ii)** පහත ප්‍රකාශනයන්ට ගැළපෙන සූත්‍ර නාම වරහන් තුළින් තෝරා ලියන්න.

(ධජග්ගසුත්ත, මහාතණ්හාසංඛයසුත්ත, ඛන්ධසුත්ත, ලක්ඛණසුත්ත, මහාසමයසුත්ත, සතිපට්ඨානසුත්ත)

(අ) ශක්‍රයාට ඇති වෙනත් නම් පිළිබඳව සඳහන් වන්නකි.

(ආ) මච්කුසක පිළිසිඳ ගැනීමට කරුණු තුනක් එක්විය යුතු බව දැක්වෙන්නකි.

(ඉ) මජ්ඣිම හා සංයුත්ත යන නිකාය දෙකෙහි ම දක්නට ලැබෙන්නකි.

(ඊ) සර්ප වර්ගයන්ට මෛත්‍රී කිරීමට උගන්වන, පිරිත් පොතට ඇතුළත් වූවකි.

(උ) සම්මාපබ්බාජනීය යන අපර නාමයකින් ද සඳහන් වන්නකි.

**(iii)** දෙවන ධර්ම සංගීතියේ සංවිධාන කටයුතු සිදු කළ ආකාරය කෙටියෙන් ගෙනහැර දක්වන්න.

**(iv)** කර්තෘ, කාලය හා අන්තර්ගතය ප්‍රකාශ වන පරිදි පහත දැක්වෙන ග්‍රන්ථයන්ගෙන් දෙකක් හඳුන්වන්න.

(අ) දාඨාවංස	(ආ) හත්ථවනගල්ලවිහාරවංස

(ඉ) ජිනචරිත	(ඊ) සමන්තකූටවණ්ණනා

(ලකුණු 5 + 5 + 5 + 5 = 20)

## ආදර්ශ පිළිතුරු

(i)

- **තන්තිභාසා** යන්න බුද්ධඝෝෂ තෙරුන් තමාගේ සඟි අටුවා හතරේදී ම පාලි භාෂාව සඳහා යොදා ඇත. (පහායාරොපයිත්වාන තන්තිභාසං මනොරමං - ධම්මපදට්ඨකථා)
- සඟි අටුවා සතරේ ම ආරම්භයෙහි **තන්තිනය** යන්න යොදාගෙන ඇත්තේ ද පාලිය සඳහා ම ය. (තන්තිනයානුච්ඡවිකං ආරොපෙන්තො විගතදොසං)
- අටුවාවන්හි නොයෙක් තැන **මාගධභාසා** යන්න මෙම භාෂාවට පර්යායව යෙදී ඇත. එමෙන් ම මාගධී හෝ මාගධීභාසා යනුවෙන් ද ව්‍යවහාරව ඇත.
- **මාගධිකා නිරුත්ති** යන්න දාඨාවංසයෙහි යෙදී ඇත්තේ ද පාලියට අපර නාමයක් වශයෙනි. (නිරුත්තියා මාගධිකාය වුද්ධියා කරොමි දීපන්තරවාසිනං අපි)
- බොධිවංසයෙහි **සත්ථුභාසා** යනුවෙන් භාවිතව ඇත්තේ ද එම අර්ථයෙහි ම ය. (දස්සයිස්සං මහාබොධි - වංසභාසාය සත්ථුනො)

(ii) (අ) ධජග්ගසුත්ත

(ආ) මහාතණ්හාසංඛයසුත්ත

(ඉ) සතිපට්ඨානසුත්ත

(ඊ) ඛන්ධසුත්ත

(උ) මහාසමයසුත්ත

(iii)

බුදුන් පිරිනිවීමෙන් වසර 100ක් ගියතැන විසාලා මහනුවර වාලුකාරාමයේ දී 700ක් භික්ෂූන් එකතුවී කරන ලද සංගීතියයි. කාකණ්ඩපුත්‍ර යස තෙරුණුවෝ චාරිකාවෙහි හැසිරෙන විට සිඞ්ගිලොණ කප්ප ආදී දසවස්තුව උපදවා විනයානුකූල නොවූ ක්‍රියාවන්හි යෙදෙන මේ භික්ෂූන් දැක මෙම සංගීතිය සංවිධානය කළහ. උන්වහන්සේ අවන්ති නුවර දක්ෂිණාපථයෙහි භික්ෂූන්ට ද පාවෙය්‍යක භික්ෂූන්ට ද අහෝගංග ප්‍රදේශයේ විසූ සාණවාසී සම්භූත තෙරුන් ප්‍රමුඛ භික්ෂූන්ට ද මේ බව දන්වා අහෝගංග පර්වතයට රැස් කරවූහ. සොරෙය්‍ය නුවර විසූ ධර්මධර රේවත තෙරනම මෙය අධිකරණයක් මගින් විසඳිය යුතු බව කීය. ඉන්පසු විසාලාවට ගොස් එහි විසූ එක්සිය විසිවස් වියැති සබ්බකාමී තෙරුන් මේ සඳහා කැමති කරවාගෙන එක් පක්ෂයකට ප්‍රධාන තෙරවරුන් හතරදෙනා බැගින් ගෙන අධිකරණයක් මාර්ගයෙන් දස වස්තුව විනිශ්චය කොට එය විනය විරෝධී බව තීරණය කළහ. අනතුරුව කාළාශෝක රජුගේ අනුග්‍රහයෙන් සත්සියයක් රහතුන්ගේ සහභාගිත්වයෙන් විශාලාමහනුවර අශෝකාරාමයේදී මෙම සංගීතිය කළහ.

(iv)

(අ) දාඨාවංසය පොළොන්නරු යුගයේ වැඩසිටි රාජගුරු ධර්මකීර්ති හිමිගේ කෘතියකි. පරිච්ඡේද 5 කි. ගාථා 415කි. පරාක්‍රම සෙන්පතියාගේ ආරාධනය පිළිගෙන පෙර සිහළ බසින් තිබූ දාඨාවංශය දේශාන්තර වාසීන්ගේ ප්‍රයෝජනය සඳහා මගධ බසට නැගීම කර ඇත. දාඨාවංශය ඛණ්ඩ කාව්‍යයකි. දීපංකර පාදමූලයේ නියත විවරණයෙන් ග්‍රන්ථය ඇරඹේ. කෙටියෙන් බුද්ධචරිතය දක්වා ධාතු බෙදීම, සතර දළදා, ගුහසීව රජුට වම්දළදාව ලැබීම, දළදාවට පැමිණි උපද්‍රව, දළදාව පෙළහර දැක්වීම, දළදාව ලංකාවට වැඩමවීම ආදී කරුණු මෙහි විස්තර වේ. විවිධ වෘත්තවලින් බඳින ලද මනහර පාලි පද්‍යය සමූහයකින් යුතු උසස් පාලි කාව්‍යයකි.

(ආ) හත්ථවනගල්ලවිහාරවංසය කර්තෘ අවිනිශ්චිත පරිච්ඡේද 11කින් යුතු චම්පු කාව්‍යයකි. දඹදෙණි යුගයේ විසූ අනවමදර්ශී සංඝරාජයන් වහන්සේගේ ආරාධනයෙන් සිරිසඟබෝ රජුගේ හිස දන්දීමේ පුවත ඇතුළත් කොට රචනා කරන ලද්දකි. පාලි සාහිත්‍යයේ ඇති උසස් ගණයේ චම්පු කාව්‍යයකි. සංස්කෘත ආභාසය ලැබී ඇත. සිරිසඟබෝ රජුගේ චරිතය, අත්තනගල්ලේ ගෝඨාභය රජු කරවූ විහාරයේ ඉතිහාසය මෙහි ඇතුළත්ය.

(ඉ) ජිනචරිතය පොළොන්නරු යුගයේ වැඩ සිටි විජයබාහු පරිවෙණාධිපති වනරතන මේධංකර මාහිමියන්ගේ කෘතියකි. ගාථා 473කි. දීපංකරපාදමූලයේ නියත විවරණ ලැබීමේ පටන් බුද්ධචරිතය කවි බසින් ලියා ඇත. සරල සුගම භාෂාවෙන් ලියන ලද උසස් පාලි කාව්‍යයකි.

(ඊ) සමන්තකූටවණ්ණනා දඹදෙණි යුගයේ වැඩ සිටි රසවාහිනිය රචනා කළ වේදේහ හිමියන්ගේ කෘතියකි ගාථා 796කි. බුදුරදුන්ගේ ලංකාගමනය, ශ්‍රීපාද ලාඤ්ඡනය පිහිටි සමනොළ කන්ද වැණුම මෙහි විශේෂ කරුණු වෙයි. මුල් ගාථා සමූහය බුද්ධචරිතය සඳහා ද සෙසු ගාථා ලක්දිව ඓතිහාසික තොරතුරු දැක්වීම සඳහා ද ලියා ඇත. විවිධ වෘත්තවලින් ලියන ලද පද්‍යයන්ගෙන් යුතු මනහර පාලි කාව්‍යයකි.

**ලකුණු දීමේ ක්‍රමය**

(i) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති කරුණුවලින් තුනක් මූලාශ්‍රය හඳුනාගනිමින් විස්තර කර ඇත්නම් ලකුණු 5ක් පිරිනමන්න.

(ii) එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් **ලකුණු 5ක්** හිමි වේ.

(iii) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති කරුණුවලට අනුව පිළිතුරු සපයා ඇත්නම් **ලකුණු 5ක්** පිරිනමන්න.

(iv) ආදර්ශ පිළිතුරේ දී ඇති කරුණු ආවරණය වන පරිදි කරනු ලබන එක් පැහැදිලි කිරීමකට ලකුණු දෙක හමාර බැගින් **ලකුණු 5ක්** පිරිනමන්න.

**05. ප්‍රශ්නය**

**(i) පහත එක් එක් ප්‍රකාශනයන්හි දක්නට ලැබෙන කාව්‍ය ලක්ෂණ පෙන්වා දෙන්න.**

(අ) උච්ඡුයන්තෙ උච්ඡුකා විය මනුස්සෙ පීළෙන්තා
(ආ) සන්තවෙසො ගුණනිධි, කරුණාමතිසාගරො
(ඉ) අනොමනාමො අම්හො නාමෙන පදුමුත්තරො
(ඊ) සුඛිතා ත්වං අම්හාකං කණ්ණමූලෙ ආසිවිසං චරන්තං න ජානාසි.
(උ) බුද්ධකරුක්ඛානං පුප්ඵං විය තාසං උතුනීභාවො

**(ii) පහත ගාථාපාදවල ව්‍යාකරණානුකූලව සන්ධි කළ හැකි පද සන්ධි කොට නිර්දිෂ්ට ග්‍රන්ථාගත විරිතට අනුව නැවත සකස් කරන්න.**

(අ) අථ අයං ඉතරා පජා, තීරං එවානුධාවති
(ආ) අනන්ත ආදීනවො කායො, විසරුක්ඛසම උපමො
(ඉ) ත්වං අපි ඉමානි රතනානි, උත්තමානි නර උත්තම
(ඊ) තං අහං ධම්මමඤ්ඤාය, අරහත්තං අපාපුණිං
(උ) තස්ස අච්චයෙ තස්ස සුතො, මුටසීවො ඉති විස්සුතො

**(iii) සිගාල සූත්‍රයට අනුව A කොටසේ දක්වෙන යුතුකම් හා වගකීම්වලට සම්බන්ධ යුගලයන් B කොටසින් තෝරා ලියන්න.**

| | A | B |
|---|---|---|
| (අ) | අච්ඡරියානං රසානං සංවිභාගෙන | භාර්යාවගෙන් ස්වාමියාට |
| (ආ) | කල්‍යාණෙන මනසා අනුකම්පන්ති | දෙමාපියන්ගෙන් දූදරුවන්ට |
| (ඉ) | සම්භතඤ්ච අනුරක්ඛති | ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට |
| (ඊ) | මිත්තාමච්චෙසු පටියාදෙන්ති | ස්වාමියාගෙන් සේවකයාට |
| (උ) | පතිරූපෙන දාරෙන සංයොජෙන්ති | මහණ-බමුණන්ගෙන් ගිහියාට |

**(iv) මහාවංසයේ නිර්දිෂ්ට කොටසට අනුව දෙවනපෑතිස් රජුගේ අභිෂේකයට සමගාමීව පහළ වූ අසිරිමත් සිදුවීම් පිළිබඳ හැඳින්වීමක් කරන්න.**

(ලකුණු 5 + 5 + 5 + 5 = 20)

## ආදර්ශ පිළිතුරු

(i) (අ) උපමාලංකාරයකි.
(ආ) රූපකාලංකාරයකි.
(ඉ) අනුප්‍රාසාලංකාරයකි.
(ඊ) සඞ්කේතාත්මක ප්‍රකාශයකි / ව්‍යංගාර්ථයකි.
(උ) උපමාලංකාරයකි.

(ii) (අ) අථා'යං ඉතරා පජා, තීරමෙවානුධාවති
(ආ) අනන්තාදීනවො කායො, විසරුක්ඛසමූපමො
(ඉ) ත්වම්පිමානි රතනානි, උත්තමානි නරුත්තම
(ඊ) තමහං ධම්මමඤ්ඤාය, අරහත්තමපාපුණිං
(උ) තස්සච්චයෙ තස්සසුතො, මුටසීවොති විස්සුතො

(iii)

| A | B |
|---|---|
| (අ) අච්ඡරියානං රසානං සංවිභාගෙන | ස්වාමියාගෙන් සේවකයාට |
| (ආ) කල්‍යාණෙන මනසා අනුකම්පන්ති | මහණබමුණන්ගෙන් ගිහියාට |
| (ඉ) සම්භතඤ්ච අනුරක්ඛති | භාර්යාවගෙන් ස්වාමියාට |
| (ඊ) මිත්තාමච්චෙසු පටියාදෙන්ති | ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට |
| (උ) පතිරූපෙන දාරෙන සංයොජෙන්ති | දෙමාපියන්ගෙන් දූදරුවන්ට |

(iv)

- සියලු ලක්දිව පිහිටි නිධාන පොළෝ මතුපිටට පැමිණීම.
- අවට මුහුදෙහි ගිලුණු නැව්වල තිබූ වස්තුව වෙරළට පැමිණීම.
- ඡාතපර්වත පාමුල රන් යෂ්ටි තුනක් පහළවීම.
- මුතුවර්ග 8ක් වෙරළට පැමිණ වැටක් ලෙස දිස්වීම.
- ඉන්ද්‍රනීල, වෛරෝඩි හා පද්මරාග යන මාණික්‍යයන් පහළවීම.

## ලකුණු දීමේ ක්‍රමය

(i) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති නිවැරදි එක් පිළිතුරකට එක ලකුණ බැගින් **ලකුණු 5ක්** පිරිනමන්න.

(ii) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති ආකාරයට ගාථා පාද නිවැරදිව ලියා ඇත්නම් නිවැරදි පිළිතුරකට එක් ලකුණ බැගින් **ලකුණු 5ක්** පිරිනමන්න.

(iii) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති නිවැරදි එක් පිළිතුරකට එක ලකුණ බැගින් **ලකුණු 5ක්** පිරිනමන්න.

(iv) ආදර්ශ පිළිතුරේ දී ඇති කරුණු ආවරණය වන පරිදි පිළිතුරු සපයා ඇත්නම් **ලකුණු 5ක්** පිරිනමන්න.

## III කොටස

### 6. ප්‍රශ්නය

**(i)** පහත දැක්වෙන නිපාත පදවල අර්ථ ලියා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| (අ) | අන්තරන්තරා | (උ) | මුහුත්තං |
| (ආ) | අථාපරං | (එ) | සචෙ |
| (ඉ) | ඛිප්පං | (ඒ) | සබ්බත්ථ |
| (ඊ) | පච්ඡතො | (ඔ) | සියා |
| (උ) | හියෙයා | (ඕ) | හෙට්ඨා |

**(ii)** පහත සඳහන් පාලි සංඛ්‍යා නාම ඉලක්කමෙන් ලියන්න.

| | | | |
|---|---|---|---|
| (අ) | අට්ඨාසීති | (ඌ) | දුවෙ |
| (ආ) | චතුරො | (එ) | පඤ්චසත |
| (ඉ) | ඡබ්බීස | (ඒ) | සට්ඨි |
| (ඊ) | තිස්සො | (ඔ) | සත්තරස |
| (උ) | ද්වාදස | (ඕ) | සතසහස්ස |

**(iii)** පහත දැක්වෙන නාම පදවල ශබ්ද ප්‍රකෘතිය හා විභක්තිය පෙන්වා දෙන්න.

| | | | |
|---|---|---|---|
| (අ) | අනාගතස්මිං | (ඌ) | පාපකො |
| (ආ) | එකෙසං | (එ) | මුනෙ |
| (ඉ) | ඨානෙහි | (ඒ) | රජෙන |
| (ඊ) | පඤ්ඤවා | (ඔ) | රාජිනො |
| (උ) | පරම්හා | (ඕ) | සිලානං |

**(iv)** පහත දැක්වෙන පදවල සමාස නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (අ) | අග්ගබ්‍රාහ්මණො | (ඌ) | පාපමිත්තානුයොගො |
| (ආ) | අනෙකසතපොරිසෙ | (එ) | පාරගාමිනො |
| (ඉ) | කායබන්ධනං | (ඒ) | යාවජීවං |
| (ඊ) | ඛජ්ජභොජ්ජං | (ඔ) | වජ්ජදස්සිනං |
| (උ) | පත්තචීවරං | (ඕ) | සත්තාහබ්භන්තරෙ |

(ලකුණු 5 + 5 + 5 + 5 = 20)

## ආදර්ශ පිළිතුරු

(i)

| | | | |
|---|---|---|---|
| අ) | අතරතුර | (ඌ) | මොහොතක් |
| (ආ) | අනතුරුව (අනෙකක්) | (එ) | ඉදින් |
| (ඉ) | වහා | (ඒ) | හැමතැනම |
| (ඊ) | පසුපසින් | (ඔ) | වන්නේය |
| (උ) | බොහෝසෙයින් | (ඕ) | යට |

(ii)

| | | | |
|---|---|---|---|
| (අ) | 88 | (ඌ) | 02 |
| (ආ) | 04 | (එ) | 500 |
| (ඉ) | 26 | (ඒ) | 60 |
| (ඊ) | 03 | (ඔ) | 17 |
| (උ) | 12 | (ඕ) | 100000 |

(iii)

| | | | |
|---|---|---|---|
| (අ) | අනාගත ශබ්දය, සත්තමී | (ඌ) | පාප ශබ්දය, පංචමී |
| (ආ) | එත ශබ්දය, චතුත්ථී/ඡට්ඨී | (එ) | මුනි ශබ්දය, ආලපන |
| (ඉ) | ධාන ශබ්දය, තතියා/පංචමී | (ඒ) | රජ ශබ්දය, තතියා |
| (ඊ) | පඤ්ඤාවන්තු ශබ්දය, පඨමා | (ඔ) | රාජ ශබ්දය, චතුත්ථී/ඡට්ඨී |
| (උ) | පර ශබ්දය, පංචමී | (ඕ) | සිලා ශබ්දය, චතුත්ථී/ඡට්ඨී |

(iv)

| | | | |
|---|---|---|---|
| (අ) | කම්මධාරය | (ඌ) | තප්පුරිස |
| (ආ) | කම්මධාරය | (එ) | බහුබ්බීහි |
| (ඉ) | තප්පුරිස | (ඒ) | අව්‍යයීභාව |
| (ඊ) | ද්වන්ද | (ඔ) | බහුබ්බීහි |
| (උ) | ද්වන්ද | (ඕ) | තප්පුරිස |

## ලකුණු දීමේ ක්‍රමය

(i) එක් නිවැරදි පිළිතුරකට **ලකුණු** භාගය බැගින් **ලකුණු 5ක්** පිරිනමන්න.

(ii) එක් නිවැරදි පිළිතුරකට **ලකුණු** භාගය බැගින් **ලකුණු 5ක්** පිරිනමන්න.

(iii) එක් නිවැරදි පිළිතුරකට **ලකුණු** භාගය බැගින් **ලකුණු 5ක්** පිරිනමන්න.

(iv) එක් නිවැරදි පිළිතුරකට **ලකුණු** භාගය බැගින් **ලකුණු 5ක්** පිරිනමන්න.

7. ප්‍රශ්නය

(i) නිවැරදි පද යොදා පහත දැක්වෙන ගාථාවෙහි හිස්තැන් පුරවන්න.

න අත්තහෙතු න ............................ ,
න ....................... න ධනං න රට්ඨං,
න ඉච්ඡෙය්‍ය .............. සමිද්ධිමත්තනො,
............ සීලවා පඤ්ඤවා ධම්මිකො .......... .

(ii) පහත දැක්වෙන පදවලට සමානාර්ථවත් පද වරහන් තුළින් තෝරා ලියන්න.

(සලිලං, සාමි, උක්ලාපො, සහායො, භූපො, නිද්දං, අරහා, සන්තො, දාරා, මුසා, සග්ගං)

| | | | |
|---|---|---|---|
| (අ) | අභූතං | (ඌ) | මිත්තො |
| (ආ) | උදකං | (එ) | සඞ්කාරං |
| (ඉ) | ඛීණාසවො | (ඒ) | සප්පුරිසො |
| (ඊ) | නරිස්සරො | (ඔ) | සුගතිං |
| (උ) | භරියා | (ඕ) | සොප්පං |

(iii) 'ධම්මපදයේ පණ්ඩිත වග්ගය පුද්ගලයාගේ මෙලොව-පරලොව දියුණුවට අදාළ සදුපදේශයන්ගේ සංග්‍රහයකි' නිදසුන් පහක්වත් ඇසුරෙන් මෙම ප්‍රකාශය සනාථ කරන්න.

(iv) වක්කලී තෙරුන් තුළ බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැවති ශ්‍රද්ධාව හා භක්තිය වක්කලිත්ථෙරාපදානය ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 5 + 5 + 5 + 5 = 20)

ආදර්ශ පිළිතුරු

(i)

න අත්තහෙතු න **පරස්ස හෙතු**, න **පුත්තමිච්ඡෙ** න ධනං න රට්ඨං,

න ඉච්ඡෙය්‍ය **අධම්මෙන** සමිද්ධිමත්තනො, **ස** සීලවා පඤ්ඤවා ධම්මිකො **සියා**.

(ii)

| | | | |
|---|---|---|---|
| (අ) | අභූතං - මුසා | (ඌ) | මිත්තො - සහායො |
| (ආ) | උදකං - සලිලං | (එ) | සඞ්කාරං - උක්ලාපො |
| (ඉ) | ඛීණාසවො - අරහා | (ඒ) | සප්පුරිසො - සන්තො |
| (ඊ) | නරිස්සරො - භූපො | (ඔ) | සුගතිං - සග්ගං |
| (උ) | භරියා - දාරා | (ඕ) | සොප්පං - නිද්දං |

(iii) පණ්ඩිත වර්ගයේ එන පුද්ගලයාගේ මෙලොව-පරලොව දියුණුවට අදාළවන පහත කරුණු පහක්වත් ඇසුරින් පිළිතුර සපයා තිබිය යුතුය.

- වරද පෙන්වා දී එයට දෝෂාරෝපණය කොට වරදින් මුදවා ගන්නා කලණ මිතුරන් ඇසුරු කළ යුතු බව (නිග්ගය්හවාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ)
- තම මිතුරන් වැරදි අසැබි දේවලින් වලක්වා ගත යුතු බව (ඔවදෙය්‍යානුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ)
- ධර්මානුකූල ජීවිතය හැමදා සතුට උදා කරන බව (ධම්මපීති සුඛං සෙති - විප්පසන්නෙන චෙතසා)
- තම අත්දැකීම් සිහිපත් කොට අධික ආශාවන්ට ගැති නොවී සිත දමනය කළ යුතු බව (අත්තානං දමයන්ති පණ්ඩිතා)
- නින්දා ප්‍රශංසාදියෙහි දී උපේක්ෂා සහගත විය යුතු බව (එවං නින්දා පසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා)
- සැපයේ දී උද්දාමයට පත්වීමත් දුකේ දී කණගාටු වීමත් උගතුන්ගේ ක්‍රියාවක් නොවන බව (සුඛෙන ඵුට්ඨා අථවා දුඛෙන නොච්චාවචං පණ්ඩිතා දස්සයන්ති)
- කිසිම හේතුවක් නිසා පණ්ඩිතයා අධාර්මික ක්‍රියාවලින් සමෘද්ධියක් අපේක්ෂා නොකරන බව

  (න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො)
- සමාජයේ යහමග යන අය විරල බව තේරුම් ගෙන වාසය කළ යුතු බව (අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො)
- කිලිටි අකුසල ධර්ම බැහැර කොට කුසල් දහම් වැඩිය යුතු බව (කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො)

(iv) වක්කලිත්ථෙරාපදානයෙහි ප්‍රකාශ වන ආකාරයට වක්කලී තෙරුන් බුදුරදුන් කෙරෙහි ශ්‍රද්ධාව හා භක්තිය උපදවා ක්‍රියා කළ ආකාරය දැක්වෙන පහත කරුණු ඇසුරෙන් පිළිතුර සපයා තිබිය යුතුය.

- බුදුරදුන් පිළිබඳ භක්තිය ඇතිවීමට තමා කුඩාකල සිට රැකබලාගත් අයුරු සිහිකරන ආකාරය මෙමගින් ධ්වනිත වෙයි. (තදාප්පභුති තෙනාහං අරක්ඛෙය්‍යෙන රක්ඛිතො සබ්බවෙරවිනිම්මුත්තො සුඛෙන පරිවඩ්ඪිතො)
- බුදුරන්දුගේ සෙනෙහස ලැබීම සියලු දෙනාගේම ආදරයට හේතුවූ අයුරු මෙම ගාථාවෙන් දැක්වේ. බුදුරදුන්ගෙන් වෙන්ව වාසය කිරීම වේදනාවක් හෙයින් කලකිරුණු වක්කලී කුමරු සත්හැවිරිදි වියේ දී පැවිදි වූයේ බුදුරදුන් දකුම හැම මොහොතේම ප්‍රිය කළ හෙයිනි. (සුගතෙන විනා භූතො උක්කණ්ඨාමි මුහුත්තකං, ජාතියා සත්තවස්සොහං පබ්බජිං අනගාරියං)
- නිරතුරු බුදුරුව දැකීම, සිහිකිරීම හා එයිනුදු තෘප්තිමත් නොවීම වක්කලි තෙරුන්ගේ භක්තිය මැනවින් ප්‍රකට කරන්නකි. (සබ්බපාරමිසම්භූතං ලක්ඛීනිලයනං පරං, රූපං සබ්බසුභාකිණ්ණං අතිත්තො පිහයාමහං)
- බුදුරදුන් වක්කලී තෙරුන්ට තම රුව බැලීම අතහැර බවුන් වඩන ලෙස කීවිට මහත් සේ දුකට පත්ව කඳුමුදුනට නැග මැරෙන්නට සිතුවේ ය. එවිට තම නම කියා අමතන බුදුරදුන්ගේ හඬ ඇසුණු ක්ෂණයේ ම වක්කලි තෙරුන් පර්වත ප්‍රපාතයට පනින්නේ අසීමිත භක්තිය නිසාය. (පක්ඛන්දිං සෙලපබ්භාරෙ අනෙකසතපොරිසෙ, තදා බුද්ධානුභාවෙන සුඛෙනෙව මහිං ගතො)

- තම ජීවිතයත් ආධ්‍යාත්මික සංවර්ධනයත් තැනූ බුදුරදුන් ගැන වක්කලී තෙරුන්තුළ අප්‍රමාණ ශ්‍රද්ධාවක් හා භක්තියක් වූ බව මේ කරුණු අනුව සනාථ වෙයි.

## ලකුණු දීමේ ක්‍රමය

(i) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති ආකාරයට එක් නිවැරදි හිස්තැන් පිරවීමකට එක් ලකුණ බැගින් **ලකුණු 5ක්** පිරිනමන්න.

(ii) එක් නිවැරදි පිළිතුරකට **ලකුණු භාගය** බැගින් **ලකුණු 5ක්** පිරිනමන්න.

(iii) ආදර්ශ පිළිතුරෙහි දී ඇති කරුණුවලින් නිදසුන් පහක් ඇසුරෙන් ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් **ලකුණු 5ක්** පිරිනමන්න.

(iv) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති කරුණු ද ඇසුරු කරගනිමින් ප්‍රමාණවත්ව සපයා ඇති පිළිතුරක සඳහා **ලකුණු 5ක්** පිරිනමන්න.